**කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව,**
**<u>මාතර දිස්ත්‍රික්කය.</u>**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 25 දිනද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**---------------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**
**-------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------------- | ------------ | ----------------- |
| (i) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.918,326 ක් වටිනා ප්‍රාග්ධන ආධාර, ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර ගිණුම්ගත කළයුතු වේ. | 2019 වර්ෂයට පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශනයේදි නිවැරදි කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.110,030 ක කර්මාන්ත වියදම වෙනුවෙන් ණය හිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ණයහිමි ප්‍රතිපාදන හඳුනාගෙන ගිණුම්ගත කළයුතු වේ. | 2019 වර්ෂයට පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශනයේදි නිවැරදි කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතු රු.300,000 ක් වටිනා ඉඩම් හා රු.813,523 ක් වටිනා ගොඩනැඟිලි | ස්ථාවර වත්කම් නිවැරදිව | 2019 වර්ෂයට පිළියෙල කරන |

| | | | |
|---|---|---|---|
| | ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කළයුතු වේ. | මූල්‍ය ප්‍රකාශනයේදි නිවැරදි කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂය අවසානයට මුද්දර ගාස්තු ආදායම් ලේඛනය හා හිඟහිටි මුද්දර ගාස්තු ලෙජර් ගිණුම අතර වෙනස වූ රු.1,399,018 ක් හඳුනාගැනීමකින් තොරව ඉකුත් වර්ෂවල ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මුද්දර ගාස්තු ආදායම නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | 2019 වර්ෂයට පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශනයේදි නිවැරදි කරමි. |

**(ආ) නොසැසඳූ පාලන ගිණුම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.8,901,952 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.1,693,537 ක අසමානතා පවතින බව නිරීක්ෂණය විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | 2006 වර්ෂයේ සිට උපයෝගී ලේඛන හා ගිණුම් අතර ඇතිවූ ශේෂ වෙනස්වීම් හේතුවෙන් මෙම වෙනස ඇතිවී ඇති අතර ඉදිරි වර්ෂ වලදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.41,491,980 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතු වේ. | හිමිකම් ඔප්පු සහ පවරාගැනිමේ ලේඛනයක් ආරම්භ කර පවත්වාගෙන යාමට කටයුතු කරන බව ඉදිරියේදී එම ලේඛන පරීක්ෂා කර බලා නිවැරදි කර ගැනිමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

## 1.4 අනුකූල නොවීම

## 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමඟ වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී කටයුතු කරමි. |
| (ආ) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපපා/ 15 හා 2007 මාර්තු 19 දිනැති ලිපිය | 2017 වර්ෂයේ සභාව සතු ඉඩම් හා ගොඩනැඟිලි සම්බන්ධව සිදු කරන ලද සමීක්ෂණ මණ්ඩලය ලබාදුන් නිර්දේශ 09 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | උපදෙස් ලිපිය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඒ සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගනිමි. |
| (ඇ) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ PE/ 01/01 හා 2010 අගෝස්තු 17 දරන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව වීථි ලාම්පු සවි නොකිරීම නිසා සභා අරමුදලෙන් එම කටයුතු සඳහා රු.472,415 ක වියදම දැරීමට සිදුවීම. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | දැනට සවිකර ඇති විජීපහන් ප්‍රමාණය අනුමත කරදෙන ලෙස විදුලිබල මණ්ඩලයට දැනුම් දුන් අතර පිළිතුරු ලැබී නැත. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායමට වඩා වැඩි වූ වියදම රු.112,566 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.4,270,045 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **ඇස්තමේන්තුගත ආදායම්,** බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් **හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2018** | | | | **2017** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,163,483 | 1,170,105 | 1,325,754 | 546,711 | 1,036,500 | 1,364,486 | 1,228,368 | 702,360 |
| කුලී | 3,694,250 | 2,328,555 | 2,561,282 | 1,137,035 | 2,841,900 | 4,834,421 | 4,700,800 | 1,369,762 |
| බලපත්‍ර ගාස්තු | 142,250 | 127,685 | 154,910 | 97,675 | 135,250 | 145,412 | 145,412 | 124,900 |
| වෙනත් ආදායම් | 31,470,680 | 27,863,514 | 21,505,934 | 11,471,504 | 27,740,000 | 27,231,041 | 28,991,239 | 5,113,924 |
| **එකතුව** | 36,470,663 | 31,489,859 | 25,547,880 | 13,252,925 | 31,753,650 | 33,575,360 | 35,065,819 | 7,310,946 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **(අ) වරිපනම්**<br>ආරම්භක හිඟය රු.470,759 ක් වූ අතර, රු.463,881 ක් වූ බිල්කිරීම් සමඟ රු.934,640 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළදී අයවීම් රු.503,788 ක් පමණක් වීම නිසා වර්ෂය අවසානයට රු.430,852 ක් තරම් ඉහළ හිඟ ශේෂයක් පැවතුණි. ආරම්භක හිඟ ශේෂයෙන් අයවීම් සියයට 48.1 ක් තරම් පහළ මට්ටමක පැවතුණි. | වරිපනම් බදු හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ගෙවීම් නොකරන වරිපනම් බදුකරුවන් සඳහා හිඟ මුදල් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. |
| **(ආ) අක්කර බදු**<br>ආරම්භක හිඟය රු.110,366 ක් වූ අතර, බිල් කිරීම් රු.12,364 විය. වර්ෂය තුළ මුළු අයවීම් රු.6,871 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.115,859 ක් හිඟව පැවතුණි. සමාලෝචිත වර්ෂයේ බිල්කිරීම්වලින් අයවීම් සියයට 15.2 ක් හා ආරම්භක හිඟයෙන් සියයට 4.5 ක් තරම් අවම මට්ටමක පැවතුණි. | අක්කර බදු හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | අක්කර බදු නොගෙවන පුද්ගලයින්ට ලිපි මාර්ගයෙන් දැනුම් දීම් මඟින් හා ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර තොරතුරු නිවැරදි කර ගැනීමෙන් අනතුරුව මෙම හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.370,334 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.11,074,390 ක් ලැබිය යුතුව තිබුණි. | උසාවි දඩ හා හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | ලැබිය යුතු මුද්දර ගාස්තුවලින් රු.1,000,000 ක් මේ වන විට ලැබී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

### 3.1.1 තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකරගැනීමට වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කළයුතු වේ. | 2018 හා 2019 වර්ෂ සඳහා අයවැය මඟින් ප්‍රතිපාදන සලසා ඇති අතර 2018 වර්ෂයේදී රු.25,988 ක් වැය කර ඇත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ 2016 ජනවාරි 13 දිනැති අංක NBRO/LR/2MD/LIMT2016/31-1960 ලිපිය මඟින් කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවට පිටුපස පිහිටා ඇති පස් කන්ද අස්ථාවර බැවින් නායයාමේ අවදානම් සහිත කලාපයට අයත් බවට නිර්දේශ කර තිබුණි. ඒ අනුව නිරාවරණය වූ කැපූ කණ්ඩි සකස් කර ස්ථාවර කිරිමට නිර්දේශ ඉදිරිපත් කර තිබුණද 2019 අප්‍රේල් 10 දින වන විටත් අදාළ කාර්යය ඉටුකර නොතිබුණි. | නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු වේ. | නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය හා තාක්ෂණික සහාය ඉල්ලා ඇති අතර විකල්පයක් ලෙස හඳුනාගත් අක්කර 7 රූඩ් 3 ක් වූ ඉඩමක් මිලදී ගැනීම සඳහා ණය මුදලක් ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලා ඇත. |
| (ආ) | 2014 වර්ෂයේදී සභාව වෙත පවරා තිබූ පුහුල්වැල්ල ජල ටැංකිය පිහිටි පර්චස් 03 ක ඉඩමේ අයිතිය හා වටිනාකම හඳුනාගෙන පැවරීම විධිමත් කිරීමට කටයුතු කර නොතිබුණි. | විධිමත් ලෙස පවරා ගැනීම සිදු කල යුතු වේ. | මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් සිදු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 02 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 06 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම කළ යුතු වේ. | තාක්ෂණ නිළධාරී තනතුරෙහි පුරප්පාඩුව මේ වන විට සම්පූර්ණ කර ඇති අතර, ඉතිරි සේවක සංඛ්‍යාව අනුමත කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් කටයුතු කර ඇති බව වාචිකව දන්වා ඇත. |
| (ii) | අනුමත නොවූ කාර්යමණ්ඩලයට අයත් පෙර පාසල් පාලිකාවක් සම්බන්ධයෙන් 2014 දෙසැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපදෙස් ප්‍රකාර කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර කාර්ය මණ්ඩලය යාවත්කාලීන කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතු වේ. | පෙර පාසල් පාලිකාවන් අනුමත කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කළද එම දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී නොමැති අතර ඒ සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවට තොරතුරු යවා ඇත. |

## 3.4 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩ සටහන යටතේ යන්ත්‍රෝපකරණවල මූලික නඩත්තුව සඳහා වැය කිරීමට අනුමත කර තිබුණු මුදලින්, රු.893,400 ක් වටිනා ටයර් 32 ක් මිලදී ගෙන තිබුණි. අවශ්‍යතාවය හඳුනා නොගෙන මිලදී ගැනීම නිසා ඉන් රු.784,500 ක් වටිනා ටයර් 26 ක් 2019 අප්‍රේල් 10 දින වන විටත් සභාවේ ගබඩාකර තිබුණි. | අවශ්‍යතාව මත මිලදී ගත යුතු වේ. | 2018 වර්ෂය තුළදි අදාළ ව්‍යාපෘති වලින් වාහන ඉවත් වීම හේතුවෙන් අවශ්‍ය කරන ප්‍රමාණය අවම විය. මිලදි ගත් ටයර් වලින් සැලකිය යුතු ප්‍රමාණයක් භාවිතයට ගත් අතර තවත් ටයර් ප්‍රමාණයක් ඉතා සුරක්ෂිතව ඉදිරියේදී භාවිතයට ගතහැකි වන පරිදි ගබඩාවේ තබා ඇත |

**3.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සභාව සතු අක්කර 01 රූඩ් 05 පර්චස් 15.37 ක් වූ ඉඩම් කැබලි 08 ක් නිෂ්ක්‍රීයව පැවති අතර, අක්කර 03 රූඩ් 01 පර්චස් 1.1 කින් යුත් ඉඩම් කැබලි 17 ක මායිම් ලකුණු කර ආරක්ෂා කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ඵලදායී කාර්යයක් සඳහා යොදාගත යුතු වේ. | සභාව සතු ඉඩම් කැබලි 17 සඳහාම ටෙන්ඩර් පත් කැඳවා කෙටිකාලීන බෝග වගාකිරීම සඳහා බදුදීමේ කටයුතු සිදු කරමින් පවති. |
| (ආ) මහජන බැංකුවේ ජංගම ගිණුම් දෙකක සමාලෝචිත වර්ෂය අවසානයට රු.206,346ක් නිෂ්ක්‍රීයව පැවති අතර, වසර දෙකක පමණ කාලයක් මෙම ගිණුම් අක්‍රීයව පැවතුණි. | නිෂ්ක්‍රීයව පැවැති මුදල් ශේෂ ඵලදායී කාර්යයකට යොදාගත යුතු වේ. | අක්‍රීය වී ඇති ගිණුම් වසා දැමීමට අනුමැතිය ලබා ගැනීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ඉල්ලීම් කර ඇත |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වැය විෂයන් 06 ක රු.4,175,786 ක ඉතිරිවීම් තිබුණි. එම අගයන් සියයට 08 සිට සියයට 40.5 දක්වා පරාසයක පැවතුනි. | තාත්වික ඇස්තමේන්තු ලේඛන පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂය වෙනුවෙන් සකස් කරන අයවැය ඇස්තමේන්තුව වියදම් විචලනය අවම කර ගනිමින් සකස් කිරිමට කටයුතු කරමි. |
| (ආ) අදායම් විෂයන් 04 ක ළඟාකර නොගත් ඉලක්කවල එකතුව 5,264,661 ක් වූ අතර එම අගයන් සියයට 3.9 සිට 37 දක්වා පරාසයක පැවතුනී. | තාත්වික ඇස්තමේන්තු ලේඛන පිළියෙල කළ යුතු වේ. | ඉදිරි වර්ෂය වෙනුවෙන් සකස් කරන අයවැය ඇස්තමේන්තුව සඳහා ආදායම් විෂයයන් වෙනුවෙන් විචලනය අවම කර ගනිමින් සකස් කිරිමට කටයුතු කරමි. |

**4.2** අභ්‍යන්තර විගණනය
-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීතුමාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ------------------------- | ----------------- | -------------------------------- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. මුදල් රෙගුලාසි 134 ප්‍රකාර අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපතිගෙන් විමසීම් කර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | අභ්‍යන්තර විගණන සැලැස්මකට අනුව මාසික අභ්‍යන්තර විගණන කටයුතු පෙරට වඩා විධිමත්ව සිදුකර ගෙනයාමට කටයුතු කරන අතර අභ්‍යන්තර විගණනයන්හි මාසිකව වාර්තා විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කරමි. |